# The Challenge

විවේකයට විනෝදයට මේ අභියෝගය විසඳන්න. A රූපය හා B රූපය බැලූ බැල්මට එක හා සමාන ය. නමුත් A රූපයේ නැති වැරදි 10 ක් B රූපයේ ඇත. හැකි නම් ඒ වැරදි 10 සොයාගන්න. B රූපය මත ඒ වැරදි රවුමකින් ලකුණු කරන්න. එසේ ලකුණු කළ B රූපය කපා අපට එවන්න. නිවැරදි විසඳුම් අතරින් තෝරා ගන්නා අයෙකුට **Sooriya Marketing Services** වෙතින් දුරකථන කාඩ්පත බැගින් හිමි වෙයි. අපේ ලිපිනය The Challenge Sannasa 22 Lorne Street Lalor Vic 3075

*මේ මාසයේ ජයග්‍රාහකයෝ*

වෙනුර වීරසිංහ - ඔෂින වීරසිංහ
10 Kenthurst Crt Mill Park

*පිළිතුරු එවූ අය අතරින්*

වෙනුර වීරසිංහ - ඔෂින වීරසිංහ මිල්පාක්
මාලිනි හැරිස් - තෝන්බරි
රෝශිණි ද සිල්වා - තෝන්ලී
අරුණි මාපා - ඇට්වුඩ්
දුලාංජනි ප්‍රනාන්දු - හැම්ප්ටන් පාක්
මල්ලිකා නිමලරත්න - ග්ලැඩ්ස්ටන් පාක්
ජගත් මනතුංග - ස්ට්‍රැත්මෝ
එච් එල් ගුණසිරි - බ්‍රෝඩ්මෙඩෝස්
පියුමි විමලරත්න - හැලම්
විමල කරුණාතිලක - තෝමස්ටවුන්
චාල්සි පියසිරි - හැම්ප්ටන්පාක්
මිහිරි ලියනගේ - හැලම්
පුෂ්පා ලුණුගම - රොක්ස්බර්ග්පාක්
දීප්තිකා අරුමප්පෙරුම - රෙසවෝ
ෂෙහාන් එමල්ක සුරවීර ආරච්චි - ක්රේගිබර්න්

පසුගිය මාසයේ විසඳුම



*සිතුවම - සුනිල් කුමාර අමරකෝන්*

**A**



**B**



නම ........................................................................................

ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න).........................................................

..........................................................................................................



# ජපන් රස කතා

ජපන් සෙන් කතා

## ෂෝන් සහ ෂෝන්ගේ මෑණියෝ

ෂෝන්, සෙන් දහම උගන්වන ගුරුවරයෙකි. ඔහු සිසුවෙකුව සිටි අවදියේම වයස්ගත මෑණියන් ඔහුගේ බාරයේ තබා පියා මිය පරලොව ගියේය. තනි වු මව රැ ක බලා ගත් ෂෝන් භාවනා ශාලාවට යන සෑම විටෙකම සිය මවද කැටුව ගියේය. සිය මව සමග පැමිණෙන බැවින් ආශ්‍රමයෙන් ආශ්‍රමයට යන ගමන් වලදී ඔහුට අන් භික්ෂූන් සමග නවාතැන් ගත නොහැකි විය. එහෙයින් ඔහු වෙනම කුඩා නිවහනක් තනා මව එහි තබා ඇප උපස්ථාන කරන අතරම සිය ආගමික කටයුතුද කරගෙන ගියේය. ඔහු සූත්‍ර, ගාථා පිටපත් කර ඉන් ලැබෙන සුළු මුදල ආහාර සඳහා වියදම් කලේය.

භික්ෂූන්ට මාළු අකැප බැවින් ෂෝන් සිය මව වෙනුවෙන් මාළු මිලදී ගෙන එන විට එය දකින අවට මිනිසුන්ගේ සමච්චලයට ලක් විය. නමුත් ෂෝන් ඒවා ගණනකට ගත්තේ නැත. නමුත් සිය පුතණුවන් අන් අයගේ උපහාසයට ලක් වනු දුටු මවගේ සිත රිදිණ. අවසානයේ දී ඇය මෙසේ කීවාය.

මම හිතනවා මමත් මෙහෙණියක් වුනොත් හොඳයි කියලා. ඒ වගෙම මම මීට පස්සෙ ආහාරයට ගන්නෙත් එළවළු විතරයි.

ඇය කී පරිදිම මෙහෙණියක වුවාය. දෙදෙනා ම එකට ධර්'මය ඉගෙන ගත්තෝය. ෂෝන් සංගීතයට දැක්-වුයේ බලවත් ලැදියාවකි. එමෙන්ම හාප් වයලීනය වාදනය කිරීමට දක්ෂයෙකි. ඔහුගේ මවද හාප් වාදනයෙහි ලා සමත්කම් දැක්වුවාය. සඳ එළිය ඇති රාත්‍රී කාල වලදී දෙදෙනාම වාදනයෙහි නියැළුනෝය.

එක් දිනක් රාත්‍රී කාලයේ ඔවුන්ගේ නිවෙස පසු කර යමින් සිටි තරුණ කාන්තාවකට සංගීත රාවය ඇසුණි. ඉන් මුසපත් වූ ඇය ෂෝන්ට ඇරයුම් කරමින් පසුදින සන්ධ්‍යා සමයේ සිය නිවෙසට පැමිණ වාදනය කරන්නැයි ඔහුගෙන් ඉල්ලා සිටියාය. ෂෝන් එම ඇරයුම පිලි ගත්තේය. දින කීපයකට පසු මහමගදී එම තරුණ කාන්තාව අහම්බෙන් මුණ ගැසුණෙන් ෂෝන් ඇගේ පෙර දින ආගන්තුක සත්කාරය සිහිපත් කර ඇයට ස්තුති කළේය. අවට සිටියවුන් ඔහුට සිනාසුණි. ෂෝන් රෑ කල පාරේ ගැවසෙන කාන්තාවකගේ නිවෙසට ගොස් තිබේ.

එක් දිනක් ෂෝන්ට දුරින් පිහිටි පන්සලක ආගමික කටයුතු සඳහා යාමට සිදු විය. මාස කිහිපයක ඇවෑමෙන් ආපසු නිවෙසට පැමිණි ෂෝන්ට දැක ගත හැකි වුයේ සිය මව මිය ගොස් ඇති බවයි. ෂෝන් කොතැනක සිටීදැයි සොයා ගත නුහුනු මිතුරන් අවමඟුල් කටයුතු සූදානම් කොට තිබුණි.

මිනිය බහාලු පෙට්ටිය අසලට ගිය ෂෝන් අතේ තිබුණු සැරයටියෙන් එයට තට්ටු කලේය.

අම්මේ, ඔබේ පුතා ආවා. යි කීවේය. නුඹ ආපසු පැමිණි එක ගැන මට සතුටුයි පුතා. මව වෙනුවෙන් ඔහු පිළිතුරු දුන්නේය.

ඔව්, මටත් සතුටුයි. ෂෝන් ප්‍රති උත්තර දුන්නේය.

ඉන් පසු ඔහු අවට සිටි පිරිස දෙසට හැරී, අවමංගල උත්සවයේ කටයුතු ඉවරයි. ඔබට දැන් මෙය භූමදාන කල හැකියි. කීවේය.

ෂෝන් වයස්ගත වු පසු දිනක් ඔහුට සිය අවසානය ළඟා වෙන බව දැණුනි. ඔහු සිය ගෝලබාලයන් අමතා එදින දහවල් කාලයේ සිය සමුගැනීම සිදු වෙන බව කියා ඔවුන්ට තමා වටේ රැ ස් වෙන මෙන් කීවේය. සිය මවගේ හා සිය පැරණි ගුරුවරයාගේ පින්තූර අබියස හඳුන්කූරු දැල්වු ෂෝන් කවියක් ලිව්වේය.

ගෙවුයෙමි හැකි තරම් දැහැමි දිවි පෙවෙතක්
මේ බවේ මග ගෙවා පනස් හය වසරක්
වස්සානය අහවරයි වැහි වළා පහව යයි
නිල්වන් අහස පුරා පායා ඇත පුන් සඳක්

ගෝල පිරිස ඔහු වටා රැ ස්ව සූත්‍ර ගායනා කලෝය. ඒ අතරවාරයේ ෂෝන් මෙලොවින් නික්ම ගියේය.

පරිවර්තනය
**ශ්‍රියා කුමාරසිංහ**


## විදෙස්ගත ශ්‍රීලාංකිකයින් ලියූ කෙටිකතා එකතුවක්

විදෙස්ගත ශ්‍රීලාංකිකයින් ලියූ සිංහල කෙටිකතා එකතුවක් ලංකාවේදී පලකිරීමට කටයුතු සංවිධානය කර-ඇත. මෙම කෘතියට ඇතුළත් කිරීම සඳහා ඔබට ද කතා එවිය හැකි අතර ඒවා විදේශීය රටක ජීවත්වන ශ්‍රීලාංකිකයින්ගේ ජීවිතවලට සම්බන්ධ කතා විය යුතුය. විදේශීය රටේදී මුහුණ පාන්නට සිදුවූ ප්‍රශ්න හෝ මව්බිමෙන් වෙන්වීමෙන් ඇතිවූ සිත්තැවුල හෝ මෙම කතාවලට තේමාව විය හැකිය

රචකයාගේ ජීවිත විස්තර හා ඡායාරූපයක් ද මෙම කෘතියට ඇතුළත් කිරීමට බලාපොරොත්තුවේ. පලකිරීමට සුදුසු කතා ශ්‍රීලංකාවේ නමගිය සාහිත්‍ය විචාරකයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් විසින් තෝරාගනු ලැබේ. වැඩි විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය

O.T.Perera
`Ethera Sita Ketikatha`
1 Bryant Court
278 The Vale Acton, London W3 7QB
Tel. 0208 743 5804